# ඇබෑර්තු

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

මාසික කොන්ත්‍රාත් දීමනාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව රු.31,040.00 ක් හා රු.7,800.00 ක ජීවන වියදමක් වේ.

02. **අධ්‍යාපන සුදුසුකම් :** ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/ සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයන් තුනකින් (03) අ.පො.ස. (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව එකවර විෂයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම වේ.

03. **වෘත්තීය සුදුසුකම් :**

i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,

හෝ

iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

හෝ

v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

vi) රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

හෝ

vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

04. වෙනත් සුදුසුකම් හා අයදුම්පත දෙපාර්තමේන්තුවේ www.excise.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2021.03.31 වේ.